## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 2017
---------------------------------------------------------------

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ 27 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිසමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය. රු.22,958,914 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2018 නව නිපැයුම්කරුවන්ගේ දිනය හා අන්තර්ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා ශාලා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් මාසයේ දී අත්තිකාරම් ලෙස ගෙවන ලද රු.1,482,797ක් ඉදිරියට කළ ගෙවීම් හෝ අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ දැක්වීම වෙනුවට 2017 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, ගිවිසුම්ගත සේවා සඳහා කලින් ගෙවීම් හා වෙනත් අත්තිකාරම් ලෙස වසර 5 කට වඩා වැඩි කාලයක සිට පවතින එකතුව රු.485,281 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නව නිපැයුම්කරුවන් සඳහා 2008 හා 2009 වර්ෂවලදී ලබාදෙන ලද ණය මුදල්වලින් හිඟ ණය ශේෂය වූ රු.9,317,683 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 3.4.3 හා 3.4.4 | වෙළෙඳපොල මිල සැදහුම් ක්‍රමය අනුව මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල සඳහන් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවිය හැකි වුවත්, සමාලෝචිත වර්ෂයතුලදී සිදුකරන ලද වටිනාකම රු.4,583,265ක් වූ ප්‍රසම්පාදනයන් 2කට අදාලව මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරාගත් ක්‍රමවේදය පැහැදිලි නොවීය. |
| (ii) 1.2.1(ඊ) | ලංසු ඇගයීමේ හා තේරීමේ කාර්යය පරිපාටියේ විනිවිදභාවය හා නිත්‍යභාවය සහතිකවීම සඳහා පිරිවිතර සකස් කිරීමේදී අවශ්‍යතාවය පැහැදිලිව දැක්විය යුතු වුවත්, වටිනාකම රු.5,305,000 ක්වූ ප්‍රසම්පාදනයන් 2කට අදාලව සකස්කර තිබූ පිරිවිතරවල කොමිසමෙහි අවශ්‍යතාවය පැහැදිලිව සඳහන්කර නොතිබුණි. |
| (ආ) 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | |
| (i) 04(අ)(1)(iii) වගන්තිය | විදේශ ගමන් සඳහා සංයුක්ත දීමනා ගෙවීමේදී දෙවන ගණය අදාළ වන නිලධාරීන් සඳහා පළමු ගණය අදාළ කර ගනිමින් සංයුක්ත දීමනා ගෙවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී විදේශීය නිපැයුම් තරඟ 2ක් සඳහා සහභාගීවූ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් දෙදෙනෙකු සඳහා සංයුක්ත දීමනා ලෙස රු. 70,178ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 843,425ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.719,018ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,562,443 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික වියදම් රු. 2,301,300 කින් හා ආයතන හා පරිපාලන වියදම් රු. 12,219,776 කින් වැඩිවුවද, පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු. 16,917,850 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදි 2013 සිට 2016 වරශය දක්වා මූල්‍ය ප්‍රතිඵලයෙහි ඌනතාවයක් දක්නට ලැබුණද, 2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් දක්නට ලැබුණි. තවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු දායකත්වය 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.23,029,875 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------------

2013 සිට 2017 වර්ෂය දක්වා කොමිසමෙහි කාර්යසාධනය හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ සහසක් නිමැවුම් ජාතික තරඟාවලිය යටතේ ඉදිරිපත් කර තිබූ නව නිපැයුම් සංඛ්‍යාව 1,118 ක් වන අතර ඉන් ජයග්‍රහණ ලබා ඇති නව නිපැයුම් ගණන 318 කි. එසේ වුවද, 2014-2017 කාල පරිච්ඡේදය තුළ පේටන්ට් ලබාගැනීම සඳහා යොමුවී තිබූ නව නිපැයුම් ගණන 63 ක් පමණක් බව නිරීක්ෂණය විය. එය තරඟාවලියට ඉදිරිපත් කළ නව නිපැයුම් ප්‍රමාණයෙන් සියයට 5 ක් හා ජයග්‍රහණය කල නව නිපැයුම් වලින් සියයට 20 ක් විය.

(ආ) නව නිපැයුම් කරුවන් සඳහා මූල්‍ය සහය සැපයීම.

-----------------------------------------------------

(i) නව නිපැයුම්කරුවන් සඳහා මූල්‍යාධාර ලබාදීමේදී මූල්‍ය සහය සැපයීම පිළිබඳ කොන්දේසි සහ මාර්ගෝපදේශයන් ඇතුළත් කාර්යපටිපාටියක් සකස්කර නොතිබුණි.

(ii) "නව නිපයුම් දිරිය 2016" වැඩසටහනින් මූල්‍යාධාර ලබාදීමට නව නිපයුම්කරුවන් 08 දෙනෙකු නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට මූල්‍ය සහාය ලබා දී තිබුණේ නිපැයුම්කරුවන් 3 දෙනෙකු සඳහා පමණි.

(iii) 2016 හා 2017 වර්ෂවලදී නව නිපැයුම්කරුවන් 11 දෙනෙකු සඳහා එකතුව රු.7,720,345 ක මූල්‍යාධාර ලෙස ප්‍රදානයකර තිබුණි. අරමුදල්වල අවශ්‍යතාවය සහ අරමුදල් අවශ්‍යවන අවස්ථාව පිළිබඳව නිසි අධ්‍යයනයකින් යුක්තව අරමුදල් ලබා නොදීම හේතුවෙන් අවස්ථා 03කදී ලබා දුන් එකතුව රු. 4,133,879ක් වූ අරමුදල්වලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. ණය හෝ ආධාර ලබාදුන් පසු ඔවුන්ගේ ප්‍රගතිය ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක් සකස්කර නොමැතිබවද තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ඇ) නව නිපැයුම් අලෙවි කිරීම සඳහා නව නිපයුම්කරුවන්ට උපකාර කිරීම කොමිසමෙහි කාර්යභාරයක් වේ. සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර තිබූ නිපැයුම් විශ්ලේෂණය කර එම නිපැයුම් වානිජකරණය කිරීමේ හැකියාව ඇති / වාණිජකරණය සඳහා උපකාර කල හැකි පෞද්ගලික ව්‍යාපාරික ආයතනවලට ආරාධනා කර නිපයුම්කරුවන් හා ආයෝජකයින් සම්බන්ධ කිරීමේ ඵලදායී අවස්ථාවක් ලෙස යොදාගත හැකිව තිබුණද, එවැනි ආයතනවලට ආරාධනා කර නොතිබුණි.

(ඈ) පාසල් වල, කාර්මික විද්‍යාල වල සහ විශ්ව විද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම කොමිසමෙහි කාර්යයක් වුවත් එවැනි සමිති සංවිධානය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට බලාපොරොත්තු වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.94,000,000ක ක්‍රියාකාරකම් 13ක් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්කර තිබුණු අතර එම ක්‍රියාකාරකම්වලින් 11ක් සඳහා භෞතික ඉලක්ක ස්ථාපිතකර නොතිබූ හෙයින් එම ක්‍රියාකාරකම්වල ලඟාකර ගත් ප්‍රගතිය හා ප්‍රතිඵලයන් ඇගයීමට ලක්කළ නොහැකි විය.

(ඊ) නිපැයුම්කරුවන් සඳහා සමාජයේ නිසි පිළිගැනීම ලබාදීමටත්, සමාජයේ පිළිගත් පුද්ගල කාණ්ඩයක් බවට තහවුරු කිරීමටත්, ඔවුන්ට ගෞරවයක් ලබා දීමටත්, නිර්මාණශීලි පුද්ගලයින් නව නිපැයුම් සඳහා යොමු කිරීමටත් අරමුණු කරගෙන හැඳුනුම්පත් ලබාදීමේ ක්‍රමවේදය 2016 වර්ෂයේ දී හඳුන්වා දී තිබුණි. හැඳුනුම්පත් 2000ක් රු. 600,000 මුදලකට මුද්‍රණය කර තිබුණු අතර 2018 මැයි වන විට හැඳුනුම්පත් නිකුත්කර තිබුනේ නිපැයුම්කරුවන් 312 ක් සඳහා පමණි.

(උ) නව නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නිපැයුම් වෙළඳපොළට රැගෙන ඒමටත්, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමටත් යාන්ත්‍රණයක් ඇති කිරීමේ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර 2018 අගෝස්තු වන විට එහි පරිපාලන කටයුතු වෙනුවෙන් රු.4,701,920 ක් වියදම් දරා ඇතත් කිසිදු නව නිපැයුම්කරුවෙකුට හෝ පර්යේෂකයෙකුට මූල්‍ය සහය ලබා දී නොතිබුණි.

(ඌ) කොමිසමේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.2,000,000ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර නව නිපැයුම්කරුවන් ලියාපදිංචිකර ගැනීම හා නව නිපැයුම් සංස්කෘතියක් ඇති කිරීම සඳහා දායක වීම මෙ හරහා බලාපොරොත්තු වුවද නිපැයුම්කරුවන් එහි ලියාපදිංචි වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද, වාණිජමය විභවයක් සහිත නිපැයුම් පිළිබඳ ප්‍රචාරණයක් වෙබ් අඩවිය හරහා සිදුකළ හැකි වුවත් එවැනි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම

--------------------------------------------------------------------------------------------------

(i) මේ සඳහා මාධ්‍ය සම්මන්ත්‍රණයක් පැවැත්වීම වෙනුවෙන් රු.1,680,000 ක් වැය කර තිබුණු නමුත් 2018 ජුනි 30 දින වනවිටත් මාධ්‍ය ප්‍රතිපත්තියක් සක්කර අනුමතකර ගෙන නොතිබුණි.

(ii) මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා රු. 125,000 මුදලක් සම්පත් දායකයෙකුට ගෙවා තිබුණද, මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කර කොමිසමට ඉදිරිපත්කළ යුතු කාලය, ආවරණය කළයුතු ක්ෂේත්‍රයන් මොනවාද යන්න ඇතුළත් කර සම්පත් දායකයා සමග ඇතිකරගත් ගිවිසුමක් නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය යාන්ත්‍රිකව කැබලි කිරීමේ හා තේරීමේ යන්ත්‍රයක් වැඩිදියුණු කිරීම වෙනුවෙන් නිපැයුම්කරුවෙකුට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නිර්දේශ මත මූල්‍යාධාර ලබා දීමට තීරණයකර තිබුණු අතර 2017 ජුලි 04 දිනැති ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ලිපිය ප්‍රකාරව යන්ත්‍රයේ පිරිවැය රු. 335,369 ක් ලෙස සඳහන් කර තිබුණු අතර යන්ත්‍රයේ යෝග්‍යතාවය පිළිබඳව පසුවට දැනුම් දෙන බව සඳහන් කර තිබුණි. එහෙත් 2017 ජුලි වන විට අදාල මුදල නිපැයුම්කරු වෙත ලබා දුන්නද 2018 අප්‍රේල් විගණන දිනවන විටත් යන්ත්‍රයේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.

(ඇ) කැළණිය විශ්ව විද්‍යාලය මගින් සංවිධානය කරන ලද " විද්‍යා 2017" ප්‍රදර්ශනය වෙනුවෙන් කොමිසම විසින් අනුග්‍රාහකත්වය ලබාදී තිබුණු අතර ඒ වෙනුවෙන් රු. 1,475,000ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුණි. ඉන් සියයට 90ක් එනම් රු. 1,327,500ක් අත්තිකාරම් ලෙස 2017 සැප්තැම්බර් 1 දින ගෙවා තිබුණු අතර 2018 අප්‍රේල් වන විටත් ඒ සම්බන්ධ වියදම් වාර්තා ලබා ගෙන නොතිබුණි.

(ඇ) විදේශීය ප්‍රදර්ශන සඳහා නිපැයුම් යොමුකිරීමේදී තෝරාගන්නා විධිමත් ක්‍රමවේදයක් පිළිබඳ නිරීක්ෂණය නොවූ අතර 45 වන ජිනීවා ප්‍රදර්ශනය සඳහා නිපැයුම්කරුවන් තෝරා ගැනීමේදී සහසක් නිමැවුම් 2016 ප්‍රදර්ශනයෙහි විවෘත අංශයෙන් ජයග්‍රහණය කරන ලද නිපැයුම්කරුවන් සඳහා අවස්ථාව ලබාදුන් බව සඳහන් කළද ක්ෂේත්‍ර 04 ක ප්‍රථම ස්ථාන ලද නිපැයුම් සඳහා අවස්ථාව ලබාදීමකින් තොරව දෙවන ස්ථානලාභී නිපැයුම් 03 ක් සඳහා අවස්ථාව ලබා දී තිබුණි. එම නිපැයුම් වෙනත් ජාත්‍යාන්තර තරඟ සඳහා යොමුකල බව සඳහන් කළ ද එසේ සිදු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා නව නිපැයුම් සහ නිපැයුම්කරුවන්ගේ නම් ඇතුළත්කර රු.390,000 ක් වැයකර පොත් 5000 ක් මුද්‍රණය කර තිබුණද එයින් රු. 192,270 ක් වටිනා පොත් 2465 ක් එනම් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. මෙම ප්‍රදර්ශනය කොමිසම මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර පෙර වර්ෂවලදී ද මෙලෙස මුද්‍රණය කරන ලද පොත් විශාල වශයෙන් ඉතිරි වී තිබියදීත් අතීත අත්දැකීම් පිළිබඳ සලකා බැලීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදීද පොත් මුද්‍රණය කිරීම නිසා මෙලෙස පාඩුවක් සිදුවී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.4,213,081ක් පැවතියද සමාලෝචිත වර්ෂය තුළදී නිපැයුම්කරුවන් 03කට පමණක් රු. 1,795,000 ක් මූලාධාර ලබාදී තිබුණු අතර අරමුදල ඌන උපයෝජිත බව නිරීක්ෂණය කෙරේ.

## 5. තිරසර සංවර්ධනය

--------------------

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

---------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා නව නිපැවුම්කරුවන්ගේ කොමිසම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර තිබුණද සිදු කිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදනයන් භාණ්ඩ, සේවා, වැඩ සහ උපදේශන සේවා ලෙස වර්ග කිරීම වෙනුවට වර්ෂය තුල සිදුකිරීමට බලාපොරොත්තුවන වැඩසටහන් අනුව වර්ගකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව භාණ්ඩ, සේවා, වැඩ සහ උපදේශන සේවා යටතේ සිදු කිරීමට බලාපොරොත්තු වන එක් එක් ප්‍රසම්පාදනයන්, ඒවායෙහි ඇස්තමේන්තුගත අගය, ප්‍රසම්පාදන ක්‍රමය, එක් එක් ප්‍රසම්පාදනයන්හි උපකාර්යයන් ඉටු කිරීම සඳහා වන කාල රාමුව ආදිය දැක්වෙන විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) උපදේශකයින් තෝරා ගැනීම හා සේවයේ නියුක්ත කරවීම සඳහා වූ 2007 මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමකින් තොරව වැඩසටහන් සංවිධායකයින් 04 දෙනෙකු භාණ්ඩ හා වැඩ සඳහා වූ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වෙළෙඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනයකර ගනිමින් තෝරාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.10,734,765ක් ගෙවීමට එකඟ වී තිබුණිද සේවාවන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නිපැයුම් වෙළඳපොළට රැගෙන ඒමටත්, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමටත් යාන්ත්‍රණයක් ඇති කිරීමේ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර එම කාර්යය වෙනුවෙන් වර්ෂයක කාලයක් සඳහා උපදේශන ආයතනයක් තෝරා ගෙන රු. 4,620,000 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම උපදේශන ආයතනය තෝරා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) BD/HRD/196/MIN/G/2017 හා 2017 ජූලි 19 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව මෙම කාර්යය වෙනුවෙන් අමතර කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වන්නේ නම් එම අවශ්‍යතාවය පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා අනුමැතිය ලබා ගන්නා ලෙස සඳහන් කර තිබුණ ද MTR/7/3/23 Vol-1 හා 2017 අගෝස්තු 31 දිනැති අමාත්‍යාංශ ලිපිය පදනම් කර ගනිමින් වර්ෂයක කාලය සඳහා උපදේශන ආයතනය බඳවාගෙන තිබුණි. එහෙත් අවශ්‍ය වන අමතර සේවක සංඛ්‍යාවක් සඳහා අනුමැතිය ලබාගැනීමට 2018 අගෝස්තු විගණන දින වන විටත් කටයුතුකර නොතිබුණි.

(ii) උපදේශන ආයතනයක් තෝරා ගැනීම වෙනුවෙන් අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා වන දැන්වීම් (Expression of Interest) කොමිසමේ වෙබ් අඩවියට අමතරව එක් පුවත්පතක පමණක් පලකර තිබුණි. වඩාත් ගුණාත්මකභාවයකින් හා ඵලදායීතාවයකින් යුත් සේවයක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදනය තරගකාරී විය යුතු බැවින් අභිලාෂ ප්‍රකාශනයන් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් පුවත්පත් සංඛ්‍යාවක දැන්වීම් පල කර නොතිබුණි.

(iii) 2007 උපදේශන ආයතනයක් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන මාර්ගෝපදේශනයන්ට පටහැනිව කටයුතු කරන ලද අවස්ථා නිරීක්ෂණය විය.

- 2.6.3 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව පත් කළ යුතු වුවත් කොමිසම විසින් එසේ කටයුතු කර නොතිබුණි.
- 3.4 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන සම්පත් පිළිබඳ අධ්‍යයනය කර පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.
- 2.3.1 (ඇ), 2.5 (ඉ) හා 6.2.1 වගන්ති ප්‍රකාරව උපදේශන ආයතනවලින් යෝජනා ලබා ගෙන උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගයීම් සිදුකර උපදේශක තෝරාගත යුතු වුවත්, එසේ සිදු කිරීමකින් තොරව අභිලාෂ ප්‍රකාශ කිරීමෙහි ලිපි ඇගයීමෙන් පමණක් උපදේශන ආයතනය තෝරා ගෙන තිබුණි.

(iv) උපදේශන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව උපදේශකයෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදු විය යුතු වුවත්, අභිලාෂයන් ප්‍රකාශ කර තිබූ ආයතනවල පළපුරුද්ද, සමාන ක්‍රියාකාරකම්, සම්පත් වෙන් කිරීම, මූල්‍ය ඇස්තමේන්තු, සපයන උපදේශන සේවා ලැයිස්තු හා නෛතික පුද්ගලභාවය යන කරුණු සම්බන්ධයෙන් අභිලාෂ ඇගයීම් කමිටුව විසින් සිදු කර තිබූ නිරීක්ෂණ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදුකර නොමැතිබව නිරීක්ෂණය විය.

(v) උපදේශන ආයතනය සමඟ එළඹී ගිවිසුමෙහි සඳහන් කාර්යයන් 13 න් කාර්යයන් 9ක් ඉටුකිරීම සඳහා උපදේශන ආයතනයක අවශ්‍යතාවයක් පවතීද යන්න විගණනයේදී ගැටලු සහගත වේ. අමතර කාර්ය මණ්ඩලයක් අනුමතකර ගැනීම සඳහා කටයුතු කලේ නම් මෙහෙයුම් පිරිවැය අවමකර රජයේ ප්‍රදාන වැඩි ප්‍රමාණයක් නව නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා යොදාගත හැකි බව නිරීක්ෂණය කෙරේ.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරකම් 04කට අදාලව ඇස්තමේන්තුව සියයට 90ත් සියයට 100ත් අතර විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය කාලානුරූපව සමාලෝචනය කර සංශෝධනය කිරීමට හැකියාව පැවතියද එසේ සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙහි මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිසමේ කොමසාරිස්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන කළමනාකරණය | (i) ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගීවන ලෙස ආරාධනයක් ලංසු කැඳවීමේ ලිපිවල ඇතුලත් නොකිරීම |
| | (ii) ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් විසින් රහස්‍යභාවය, අපක්ෂපාතීභාවය හා පෞද්ගලික බැඳියාවන් නොමැති බව පිළිබඳ ප්‍රකාශනයක් සිදු කර නොතිබීම. |
| | (iii) ලංසු විවෘත කිරීමේදී ලංසුකරුවන්ගේ නියෝජිතයන් පැමිණි බව හෝ නොපැමිණි බව තහවුරු කරන ලේඛන පවත්වා නොගැනීම. |

(iv) භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් සිදු කර තිබීම.

(v) උපදේශන ප්‍රසම්පාදනයේදී, අභිලාෂය ප්‍රකාශ කිරීමේ දැන්වීම සඳහා උපදේශන ප්‍රසම්පාදන කමිටුවෙහි අනුමැතිය ලබා නොගැනීම

| | | |
|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනයෙහි අනුක්‍රමික අංක සටහන් කර නොතිබීම. |
| | | (ii) භාණ්ඩ ලේඛන පොත වාර්ෂිකව තුලනයකර නොතිබීම |
| | | (iii) අවස්ථා 2 කදී ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි සඳහන් සන්නම්නාමය හා භෞතිකව පැවති සන්නම්නාමය වෙනස්වීම |
| (ඇ) | අත්තිකාරම් ලබා දීම | අත්තිකාරම් පියවීම සඳහා දීර්ඝ කාලයක් ගත කිරීම |
| (ඈ) | ගිණුම්කරණය | එක් පොදු ජ'නල අංකයක් යටතේ ජ'නල සටහන් දෙක බැගින් යොදා තිබූ අවස්ථා පැවතීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | වැඩසටහන් සංවිධානය කිරීමේදී සහභාගීවන සංඛ්‍යාව නිවැරදිව පුරෝකථනය නොකිරීම |